මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

# ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා ඉහළම තලයක : නියෝජ්‍ය ඉන්දියානු මහ කොමසාරිස්

ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය ඉන්දියානු මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා 2023 මාර්තු 3 වන දින කොළඹ දී "මෙඩිකෙයා 2023" ප්‍රදර්ශනය විවෘත කිරීමේ උත්සවය සඳහා සහභාගී විය. මෙම අවස්ථාව ඇමතූ නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා, මේ වන විට ඉන්දියා - ශ්‍රී ලංකා ද්විපාර්ශවික සබඳතා ඉහළම තලයක පවතින බව පැවසූ අතර මේ සඳහා මූලික වශයෙන් හේතු වී ඇත්තේ දෙරට ජනතාව අතර ගැඹුරින් මුල් බැසගත් බැඳීම් බව ප්‍රකාශ කළේය. විශිෂ්ට ද්විපාර්ශවික සබඳතාවය සඳහා මූලික වන විශේෂ කරුණු පහක් පිළිබඳව මහ කොමසාරිස්තුමා මෙහිදී සඳහන් කළේය.

2. මේ අතරින් පළමු වැන්න වන්නේ ඉන්දීය ජනතාව සහ රජය වැක්සින් මෛත්‍රී ලබා දුන් කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සහය ලබා දීම සහ ශ්‍රී ලංකා රජය විසින් සංචාරක සීමා ලිහිල් කළ වහාම කඩිනමින් වෛද්‍ය වීසා නිකුත් කිරීම

3. දෙවනුව, කොවිඩ් සමය තුළ 1990 සුවසැරිය ගිලන්රථ විසින් ලබාදුන් කැපී පෙනෙන සේවය සහ මහනුවර, හම්බන්තොට සහ යාපනය රෝහල්වලින් සිදු කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් වෛද්‍ය සැපයුම් ලබා දීම

4. ශ්‍රී ලංකා රජය විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව ඉන්දීය ජනතාව සහ රජය 2022 වසරේදී ඇමරිකානු ඩොලර් බිලියන 4ක ආර්ථික, මූල්‍ය සහ මානුෂීය සහයෝගයක් ලබා දීම

5. සිව් වෙනුව ඉන්දියාව G20 සමුළුවලදී ශ්‍රී ලංකාවට සහයෝගය ලබා දුන් අතර ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට 2023 ජනවාරි මාසයේදී වොයිස් ඔෆ් ග්ලෝබල් සවුත් සමුළුව සඳහා සහභාගී වන ලෙස ආරාධනා කිරීම

6. පස් වෙනුව මෑත කාලීන අත්දැකීම් අනුව, සෞඛ්‍ය සහ යහපැවැත්ම යන ක්ෂේත්‍රය මෙන්ම සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම තුළ වඩා ගැඹුරු සබඳතා ගොඩනැගීම සඳහා සැලකිය යුතු අවස්ථාවන් පැවතීම

7. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මෙම විවෘත කිරීමේ අවස්ථාවේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී විය. වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා, පාරම්පරික වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධන, ග්‍රාමීය සහ ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි, හිටපු සෞඛ්‍ය අමාත්‍යවරුන් වන රාජිත සේනාරත්න සහ එම්. එච්. එම්. ෆවුසි, ලංකා කම්කරු කොංග්‍රසයේ සභාපති සෙන්තිල් තොණ්ඩමාන්, ලේකම්වරුන් වන ආචාර්ය අමල් හර්ෂ ද සිල්වා සහ එස්. ජානක ශ්‍රී චන්ද්‍රගුප්ත යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

8. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිරත ඉන්දියානු සමාගම් 40කගෙන් පමණ සමන්විත නියෝජිත පිරිසක් 2023 මාර්තු 3-5 දිනවල

පැවැත්වෙන "මෙඩිකෙයා 2023" ප්‍රදර්ශනය තුළ "ඉන්ඩියා පැවිලියන්" නමින් ප්‍රදර්ශන කුටියක් සංවිධානය කර ඇත.

***

කොළඹ
2023 මාර්තු 3